# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2394/48 - 2024 ජූලි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2024.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා පනත**

6 වන වගන්තිය යටතේ වූ නියමය

2010 අංක 14 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා පනතේ 6 වන වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින්, මේ නියමය මඟින්, 2013 පෙබරවාරි මස 15 වන දින අංක 1797/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝගය පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනය

(1) එහි සිංහල භාෂාවෙන් වන නියෝගයෙහි ශීර්ෂයෙහි සහ පළමු වන ඡේදයෙහි සඳහන් “නියෝගය” සහ “නියෝගයෙන්” යන වචන ඉවත් කර ඒ වෙනුවට පිළිවෙලින් “නියමය” සහ “නියමයෙන්” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම සංශෝධිත නියමයේ පළමුවන උපලේඛනයේ අංක 3 යටතේ දක්වා ඇති නියමය හා කොන්දේසිය ඉවත් කර, පහත දැක්වෙන නියමය හා කොන්දේසිය ආදේශ කිරීමෙන්;

"3. ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් රජය වෙනුවෙන් දරනු ලබන චංචල හා නිශ්චල දේපල ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් යථා පරිදි පවත්වාගෙන යා යුතු අතර, එකී නිශ්චල දේපල තුන්වන පාර්ශවයක් සඳහා බදු දීම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව සිදු නොකළ යුතුය."

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍ය.

2024 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0241

1A - G 42312 — 54 (2024/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*